(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 31]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 ඔක්තෝබර් මස 22 වැනි බදාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0089/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රජයෙන් නිසි උපදෙස් නොලැබීම නිසා, මුදල් බවට පත්කර ගැනීමට නොහැකිව රාජ්‍ය ආයතන සතුව තිබෙන විදේශ මුදල් ප්‍රමාණය කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, මහජන බැංකුව සහ ලංකා බැංකුව සම්බන්ධයෙන් ඉහත සඳහන් තොරතුරු ඇතුළත් අංග සම්පූර්ණ ලැයිස්තුවක් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වරද නිවැරදි කිරීමෙහි ලා ගනු ලබන පියවර කවරේද;

(ii) ජාතික ගිණුම් සැකසීමේදී මෙම අවිනිශ්චිත වගකීම සලකා නොබැලීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0090/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිදහස ලබා ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා රජය පළමුවැනි වරට විදේශීය ආයතනවලින් සහ රටවලින් ණය ලබාගත් දිනය කවරේද;

(ii) එවකට බලයේ සිටි ජනාධිපතිවරයාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ නම් සහ අදාළ වර්ෂය කවරේද;

(iii) පළමුවැනි එක්සත් ජනපද ඩොලර් භාණ්ඩාගාර බැඳුම්කරය නිකුත් කළ දිනය කවරේද;

(iv) එවකට සිටි ජනාධිපතිවරයාගේ, අග්‍රාමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ නම් කවරේද;

(v) රජයක් විසින් පළමුවැනි වතාවට එක්සත් ජනපද ඩොලර් වාණිජ ණයක් ලබා ගැනීමට කටයුතු කළ දිනය කවරේද;

(vi) එවකට සිටි ජනාධිපතිවරයාගේ, අග්‍රාමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අද වන විට පවතින මුලු ණය ප්‍රමාණය හා දේශීය හා විදේශීය ණය ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අද වන විට පවතින ඒක පුද්ගල ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0091/'08

3\.
ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) රට වෙනුවෙන් ඇති සංචිතයක් ලෙස මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන මුළු රත්‍රන් ප්‍රමාණය කොපමණද;

(ii) දඩ මුදල්, රාජසන්තක කිරීම් සහ පුද්ගලයින් සඳහා හෝ ආයතන සඳහා පැනවූ දඩුවම් වෙනුවෙන් මහ බැංකුව වෙත රඳවාගෙන ඇති රත්‍රන් ප්‍රමාණය කොපමණද;

(iii) විකුණා දමනු ලැබූ රත්‍රන් ප්‍රමාණය ඊට අදාළ වටිනාකම සමග කොපමණද;

(iv) මහ බැංකුව විසින් රත්‍රන් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන හේතුව කුමක්ද;

යන්න 1994 වර්ෂයේ සිට වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රත්‍රන් විකිණීමේදී තරඟකාරී මිල ගණන් කැඳවීමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, 2006 ජනවාරි මාසයේ සිට ඉදිරියට ඒ හා සම්බන්ධයෙන් කළ කටයුතු කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0207/'08

4\.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) වැවිලි කර්මාන්ත (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0208/'08

5.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමියගෙන් ඇසීමට,—(1)

(අ) (i) ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි (කැබිනට්) අමාත්‍යතුමිය සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0209/'08

6.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) පළාත් පාලන හා පළාත් සභා (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0380/'08

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—(1)

(අ) අතිගරු ජනාධිපතිතුමා 2007 වර්ෂයේ අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් අඩු ආදායම් ලාභීන්ගේ නිවාස ණය කපාහැරීමට යෝජනාවක් ඉදිරිපත් කළ බව එතුමිය දන්නෙහිද?

(ආ) එම නිවාස ණය කපා හැරීම සිදු කරනුයේ කවර කාල සීමාවක් සඳහා කවර දිනක සිටද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) බුත්තල ගම්උදාව යටතේ ඉදිකළ නිවාසවල පදිංචි අඩු ආදායම් ලාභීන්ගෙන් මේ දක්වා මාසිකව ණය මුදල් අය කර ගන්නා බව එතුමිය පිළිගන්නෙහිද?

(ඈ) මෙම අයගේ නිවාස ණය කපා හැරීමට කටයුතු කරන්නේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0414/'08

8.

ගරු පියසිරි විජේනායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) රාජ්‍ය සේවකයෙකු පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වූ විට ඔහුට රාජ්‍ය සේවයේ යෙදෙමින් පළාත් සභා මන්ත්‍රී ධූරය දැරිය හැකිද;

(ii) ඔහු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1189 (1) අනුව වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම හෝ විශ්‍රාම ගැන්වීම කළ යුතුද;

(iii) එසේ නොමැතිව ඔහුට තවදුරටත් රාජ්‍ය ආයතනයේ සේවය හා පළාත් සභා මන්ත්‍රී ධූරය යන දෙකම දැරිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ලංකා බැංකු සේවකයෙකු වන ඒ. ඒ. එච්. ප්‍රනාන්දු මහතා ලංකා බැංකුවේ සේවය කරමින් වැටුප් ලබා මධ්‍යම පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔහු රාජ්‍ය මුදල් වංචාකර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) ඔහු එම වැටුප් දෙකම ලබා ගෙන ඇත්තේ කවර වර්ෂවලද;

(ii) එසේ නම්, ඔහුට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0481/'08

9\.

ගරු විජිත රණවීර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂය තුළදී හම්බන්තොට දිස්ත්‍රික් රන් එළිවැට විදුලි ව්‍යාපෘතිය යටතේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් එක් විදුලිබල සංවර්ධන කාර්යය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ 2008 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල සහ එක් එක් යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කරන මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂය අවසන් වන විට ලබා දී තිබූ මුලු විදුලි සම්බන්ධතා සංඛ්‍යාව සහ 2007 වර්ෂයේ දී ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2007 වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව, පළාත් සභා, අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධාන මගින් අදාළ කොට්ඨාසයට විදුලිය සැපයීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන්ව කොපමණද;

(iii) එකී මුදලින් ලබා දී ඇති විදුලි සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලංකා විදුලිබල මණ්ඩලය මගින් පහසුකම් සපයා නොමැති නිසා විදුලිය ලබා නොගත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එකී කොට්ඨාසයට අදාළව රන් එළිවැට විදුලි ව්‍යාපෘතියේ 2007 සැලසුම් සහ ඉලක්ක සම්පූර්ණ කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0482/'08

10\.

ගරු විජිත රණවීර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂය තුළදී හම්බන්තොට දිස්ත්‍රික් රන් එළිවැට විදුලි ව්‍යාපෘතිය යටතේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් එක් විදුලිබල සංවර්ධන කාර්යය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ 2008 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල සහ එක් එක් යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කරන මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂය අවසන් වන විට ලබා දී තිබූ මුලු විදුලි සම්බන්ධතා සංඛ්‍යාව සහ 2007 වර්ෂයේ දී ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2007 වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව, පළාත් සභා, අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධාන මගින් අදාළ කොට්ඨාසයට විදුලිය සැපයීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන්ව කොපමණද;

(iii) එකී මුදලින් ලබා දී ඇති විදුලි සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලංකා විදුලිබල මණ්ඩලය මගින් පහසුකම් සපයා නොමැති නිසා විදුලිය ලබා නොගත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එකී කොට්ඨාසයට අදාළව රන් එළිවැට විදුලි ව්‍යාපෘතියේ 2007 සැලසුම් සහ ඉලක්ක සම්පූර්ණ කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0483/'08

11.

ගරු විජිත රණවීර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂය තුළදී හම්බන්තොට දිස්ත්‍රික් රන් එළිවැට විදුලි ව්‍යාපෘතිය යටතේ ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් එක් විදුලිබල සංවර්ධන කාර්යය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ 2008 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල සහ එක් එක් යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කරන මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂය අවසන් වන විට ලබා දී තිබූ මුළු විදුලි සම්බන්ධතා සංඛ්‍යාව සහ 2007 වර්ෂයේ දී ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2007 වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව, පළාත් සභා, අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධාන මගින් අදාළ කොට්ඨාසයට විදුලිය සැපයීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන්ව කොපමණද;

(iii) එකී මුදලින් ලබා දී ඇති විදුලි සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලංකා විදුලිබල මණ්ඩලය මගින් පහසුකම් සපයා නොමැති නිසා විදුලිය ලබා නොගත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එකී කොට්ඨාසයට අදාළව රන් එළිවැට විදුලි ව්‍යාපෘතියේ 2007 සැලසුම් සහ ඉලක්ක සම්පූර්ණ කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0501/'08

12.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවේ සේවය සඳහා ශ්‍රී ලංකා රාජ්‍යයෙන් හයිටි රාජ්‍යය වෙත යවන ලද සෙබළ හා සෙසු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් හයිටි රාජ්‍යයේ සාමසාධක හමුදා රාජකාරීන් සඳහා දිවයිනෙන් පිටත්කර යැවූ දිනය කවරේද;

(iii) හයිටි සාමසාධක හමුදාවේ ඔවුන් සේවය කළ කාලය කොපමණද;

(iv) ඔවුන් ආපසු දිවයිනට එවන ලද්දේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) ආපසු දිවයිනට එවන ලද සෙබළුන්ට මාස 06ක එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා සේවය වෙනුවෙන් ඔවුනට හිමි වැටුප් මේ වනතෙක් ගෙවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) ඔවුනට හිමි එකී හිඟ වැටුප් ගෙවනු ලබන්නේ කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0502/'08

13.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වර්ෂයේ පුහුණුව ලබා කම්කරු අමාත්‍යාංශය හා විදේශ රැකියා පුද්ගලික සමාගම මගින් ඉතාලියේ හෙද සහායිකා තනතුර සඳහා පිටත්කර යැවීමට තෝරා ගන්නා ලද ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) තෝරාගත් අයගේ නම, ලිපිනය හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එලෙස තෝරා ගන්නා ලද අය අතුරින් මේ වනවිට උක්ත රැකියාව සඳහා ඉතාලියට පිටත්කර යවා ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම, ලිපිනය, ගුවන් ගමන් බලපත්‍ර අංකය, විදේශගත වූ දිනය හා වේලාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) තෝරාගත් සුදුසුකම් සහිත පුහුණුව ලද අය වෙනුවට වෙනත් අය මෙලෙස ඉතාලියට පිටත්කර යවා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉතාලියේ පුද්ගලික සුවසේවා හෙද සහායිකා තනතුර සඳහා තෝරාගත් අයගේ රැකියා තත්ත්වය හා ආදායම් මට්ටම සම්බන්ධයෙන් ඉතාලි රජය විසින් මේ වනවිට විමසා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0505/'08

14.

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් කළමනාකරණය කිරීමේ වගකීම පවරා ගෙන ඇති තානායම් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පාලන ආයතන සතුව තිබී, පසුව නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ කළමනාකරණය යටතට පත් වූ තානායම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් සහ එලෙස කළමනාකරණය භාර ගනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් පාලන ආයතනවල අයිතිය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාළ බදු මුදලින් කොපමණ ප්‍රතිශතයක් එකී පළාත් පාලන ආයතනය වෙත ලබා දෙන්නේද;

(ii) පළාත් පාලන ආයතන සතු තානායම් පවරාගත් දින සිට 2007.12.31 වැනි දින දක්වා එම තානායම් වෙනුවෙන් අදාළ මුදල් ප්‍රතිශතය ලබා දී තිබේද;

(iii) එසේ නොමැතිනම්, එම මුදල් ප්‍රතිශතය ලබාදීමට ඇති තානායම් හා ගෙවිය යුතු හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0506/'08

15.

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාතලේ මහ නගර සභාවට අයත් තානායම වෙනුවෙන් මසකට ගෙවනු ලබන වාරික මුදල කොපමණද;

(ii) එම තානායමේ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතලේ තානායම 2007.09.05 වැනි දින මුද්‍රා තබන ලද බවත්;

(ii) එම තානායම 2008 මාර්තු මාසය වනතෙක් බදුදීමට නොහැකි වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත කාලය අතරතුර සේවය අහිමි වූ අය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නේද;

(ii) අදාළ කාලය තුළ මාතලේ මහ නගර සභාවට සිදු වූ අලාභය සම්බන්ධයෙන් වගකිව යුත්තේ නාගරික සංවර්ධන අධිකාරිය නම් එම අලාභය පියවීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මාතලේ තානායම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීමේ දී ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ ඉල්ලුම්කරුවන් හා ඔවුන්ගේ මූල්‍යමය හැකියාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) තෝරාගත් ඉල්ලුම්කරුවන්ගේ මූල්‍යමය හැකියාව හා වෘත්තීය නිපුණතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## යෝජනා පිළිබඳ දැනුම් දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 12.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 1),— ජිනීවා නුවර පැවති අන්තර් පාර්ලිමේන්තු සංගමයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මානව හිමිකම් කමිටු රැස්වීමට තමා සහභාගී වීම සම්බන්ධයෙන් රාජ්‍ය ජනමාධ්‍ය මගින් තමාගේ කීර්ති නාමයට හානිවන ආකාරයෙන් අසත්‍ය සහ අභූත චෝදනා ප්‍රචාරය කිරීම තුළින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තමාගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා විසින් 2007 ඔක්තෝබර් මස 24 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

4.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 2),— පිටස්තර පුද්ගලයන් දෙදෙනෙකු නිසි අවසරයකින් තොරව පාර්ලිමේන්තු පුස්තකාලයට ඇතුළු වී තමා විසින් පාර්ලිමේන්තුවේ දී කරන ලද කථා කිහිපයක වාර්තා රැගෙන යාමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තමාගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දයාසිරි ජයසේකර මහතා විසින් 2007 නොවැම්බර් මස 14 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

5.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 3),— අයවැය විවාදය පැවති දිනවල එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් තිදෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පදනම් විරහිත ලෙස ප්‍රශ්න කරනු ලැබීම මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් ඔවුන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2007 නොවැම්බර් මස 16 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

6.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 4),— තමා ජනාධිපතිතුමන් හමුවී රජය හා එක්වීමට කැමැත්ත පළ කළ බවට "ද අයිලන්ඩ්" පුවත්පතේ 2007 නොවැම්බර් මස 16 වැනි දින අසත්‍ය වාර්තාවක් පළ කිරීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තමාගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. මහරූෆ් මහතා විසින් 2007 නොවැම්බර් මස 16 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

7.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 5),— 2007 නොවැම්බර් මස 15 වැනි දින ස්වාධීන රූපවාහිනී ප්‍රවෘත්ති විකාශය තුළින් අයවැය විවාදයට සහභාගි වෙමින් තමා විසින් එදින කරන ලද කථාව බරපතල ලෙස විකෘති කරනු ලැබීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තමාගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. කේ. සුබසිංහ මහතා විසින් 2007 නොවැම්බර් මස 16 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

8.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 6),— ගරු ටී. කනගසබෙයි මන්ත්‍රීතුමාගේ බෑනනුවන් කිසියම් සන්නද්ධ කණ්ඩායමක් මගින් පැහැර ගෙන යාම හා ගරු කේ. තන්ගේෂ්වරී මන්ත්‍රීතුමියගේ හා ගරු පී. අරියනේත්‍රන් මන්ත්‍රීතුමාගේ ආරක්ෂාව ඉවත් කිරීම මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් ඔවුන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්. සම්පන්දන් මහතා විසින් 2007 නොවැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

9.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 7),— මන්ත්‍රීවරුන් මිල දී ගැනීමට දරන ලද උත්සාහයක් නිසා මහජන නියෝජිතයන් වශයෙන් තමන්ගේ ප්‍රතිරූපයට හානි වීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තමාගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විමල් වීරවංශ මහතා විසින් 2007 නොවැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

10.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 8),— ජාතික රූපවාහිනිය සහ ස්වාධීන රූපවාහිනිය ඔස්සේ තමන්ගේ සහෝදරයා වන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගාමිණී අතුකෝරල මහතාගේ මරණය පිළිබඳව ජාතිය ගොඩනැඟීමේ අමාත්‍ය ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා විසින් පාර්ලිමේන්තුවේ දී කරන ලද ප්‍රකාශයක් නියම තත්ත්වය වසන් කරමින් ප්‍රචාරය කිරීම මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක වශයෙන් තමාගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රීනි ගරු තලතා අතුකෝරල මහත්මිය විසින් 2007 නොවැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

9.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 9),— තමා ජනාධිපතිතුමන් හමුවී රජය හා එක්වීමට කැමැත්ත පළ කළ බවට "ද අයිලන්ඩ්" පුවත්පතේ 2007 නොවැම්බර් මස 16 වැනි දින අසත්‍ය වාර්තාවක් පළ කිරීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තමාගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා විසින් 2007 නොවැම්බර් මස 20 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

10.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 10),— තමා පාර්ලිමේන්තුවට පැමිණීම වැලැක්වීමේ අරමුණින් හමුදා නිලධාරීන් කිහිපදෙනෙකු තමාගේ නිවසට ඇතුළු වී තමන් පිළිබඳව විමසීම මගින් තමාගේ වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සාගල රත්නායක මහතා විසින් 2007 නොවැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— 2009 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2009 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළිබඳ කාරක සභා අවස්ථාවේ වැඩ සටහන සඳහා වෙන්කොට ඇති කාලසීමාව, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණය පරිදි දින 16 ක් පමණක් වන හෙයින් ද,

අයවැය කාරක සභා අවස්ථාවේ වැඩ සටහන සඳහා දිනකට පැය 07 ක් පමණ වෙන්කර ඇති අතර, එක් දිනක දී අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීමට සිදුව ඇති හෙයින්, ඒ අනුව එක් වැය ශීර්ෂයක් සඳහා වෙන් කරනු ලැබ ඇත්තේ දළ වශයෙන් පැය 02 ක පමණ කාල සීමාවක් වන හෙයින් ද,

පාර්ලිමේන්තුවේ ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ සහ ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ එකඟත්වය පරිදි තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අයවැය ඇස්තමේන්තු පිළිබඳ දෙවැනිවර කියවීමේ විවාදය ආරම්භ කළ දින සිට දෙවැනිවර කියවීමේ විවාදයේ ඡන්දය විමසන දිනය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රැස්වී සාකච්ඡා කළ හැකි වන පරිදි විශේෂ කාරක සභාවක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කරනු ලැබිය යුතුය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව ආණ්ඩු පක්ෂයෙන් හා විපක්ෂයෙන් තෝරාගනු ලැබූ සාමාජිකයන් තිස් එක් (31) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතුය.

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට ද බලය තිබිය යුතුය.

4. එකී තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් හි කාරක සභා අවස්ථාව ආරම්භ කරන දින හෝ එදිනට පෙර කාරක සභාව සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

*3.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*6.

මෝටර් වාහන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ජාතික ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*11.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*14.

අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*15.

ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*16.

විසර්ජන පනත් කෙටුම්පත (2009) — දෙවැනි වර කියවීම.

*17.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*18.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*19.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*20.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*21.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 “ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම” දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000<br>රු. 680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000<br>රු. 3,900,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 400,000,000<br>රු. 550,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1) — ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 අප්‍රේල් මස 30 දිනැති අංක 1547/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2) — ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 අගෝස්තු මස 26 දිනැති අංක 1564/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නියෝග,— 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 29 වැනි වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග කියවිය යුතු ඉහත කී පනතෙහි 6 වැනි වගන්තියේ (ආ) ඡේදය යටතේ ගනුදෙනුකරුවෙකුගේ ඉල්ලීම මත සිදු කරන විද්‍යුත් අරමුදල් මාරුවකදී මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු මුදල් ප්‍රමාණයේ අවම සීමාව නියම කරමින් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 25 දිනැති අංක 1555/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*26.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද “2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග” අනුමත කළ යුතුය.

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*28.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*29.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධුරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධුරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධුරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*34.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*35.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*36.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

37.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---